කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 25

මගේ අංකය: ඩීඑම්එස්/වැටුප්/පොදු,
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.

2004.12.28

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල
සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් සභාපතිවරුන් වෙත.

**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවක වැටුප් ප්‍රතිශෝධනය කිරීම.**

01. 2004 දෙසැම්බර් මස 27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 9/2004 මගින් 2005 අයවැය යෝජනා අනුව 2004 දෙසැම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවකයන්ට පිරිනැමූ වැටුප් වැඩිවීම කොළඹ පාරිභෝගික මිල දර්ශකයට සම්බන්ධ කොට ගත් විචල්‍ය ජීවනාධාර දීමනාවක් ගෙවනු නොලබන්නා වූ හෝ වෘත්තීය සංගම් හෝ සේවකයන් සමග එළඹ ඇති සාමූහික ගිවිසුම්වලින් ආවරණය නොවන්නාවූ හෝ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවකයන් සඳහා ද එදින (2004.12.01) සිට ම දීර්ඝ කළයුතු යැයි රජය තීරණය කර ඇත.

02. මෙම වැටුප් ප්‍රතිශෝධනයේ දී වැටුප් ආගණනය කල යුත්තේ ඊට අදාළ සෑම සේවකයකුට ම තම මූලික වැටුපෙන් 40% ක වැටුප් වැඩිවීමක්, මසකට රු.3250/- ක අවමයකට සහ රුපියල් 9000/- ක උපරිමයකට යටත්ව ලැබෙන පරිද්දෙනි. 2004.01.02 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 21 හි විධිවිධාන අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරනු ලැබ ඇති වැටුප් පරිමාණයන් පාදක කොටගෙන මෙම වැටුප් පරිවර්තනය සිදුකළ යුතුය.

<u>උදාහරණ:</u>

| වර්තමාන වැටුප(වාර්ෂික) | ප්‍රතිශෝධිත වැටුප (වාර්ෂික) |
|---|---|
| රු.65,760-1320x11-1560x5- 88,080/- | 104,760-1320x11-1560x5-127,080/- |
| රු.80,820-1320x6-1560x10-104,340/- | 119,820-1320x6-1560x5-2160x5-146,340/- |
| රු.179,520-6120x8-228,480/- | 251,340-8580x8-319,980/- |
| රු.280,500-11,220x4-325,380/- | 388,500-11,220x4-433,380/- |

03. පියවරින් පියවරට තැබීමේ පදනම මත සිදුකරනු ලබන මෙම වැටුප් ප්‍රතිශෝධනයෙහි වැඩිවීමෙන් 50% ක් හෝ මසකට රු.2500/- ක් හෝ යන දෙකින් වැඩි මුදල, 2004.12.01 දින සිට ද ඉතිරි හිමිකම 2006.01.01 දින සිට ද ක්‍රියාත්මක විය යුතුය. එහෙත්, වැටුප් ප්‍රතිශෝධන තුලින් මේ වන විට පැනනැගී ඇති වැටුප් විෂමතා ඉවත් කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි ද රජයේ අවධානය යොමුවී ඇති බැවින් එබදු විෂමතා බලපාන නිලධාරීන් දෙවන පියවරට අදාල වැටුප් වැඩිවීමට හිමිකම් ලබනුයේ ඒ පිළිබඳව පරිපාලනය පිළිබඳ ජාතික සභාවේ නිර්දේශයන්ට අනුකූලව පමණි. එබැවින්, මේ වන විට නොවිසඳුන විෂමතා වේ නම් ඒවා පරීක්ෂා කර බලා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ඒ පිළිබඳ විස්තර 2005.03.31 දිනට පෙර (කොළඹ 07, බෞද්ධාලෝක මාවත, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පිහිටි) පරිපාලනය සඳහා වන ජාතික සභාව වෙත යොමු කළ යුතුය.

04. 2000.09.11 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 7 සහ 2001.10.18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 12 මගින් ගෙවීමට බලය දෙන ලද අන්තර් දීමනාවන් මෙම වැටුප් වැඩිකිරීමට සමාන්තරව තවදුරටත් ගෙවිය යුතුය. ඉහත 2000.09.11 දිනැති චක්‍රලේඛ අංක 7 අනුව හිමිවන 10% අන්තර් දීමනාව දැන් ආගණනය කළයුත්තේ 2004.12.01 දිනට නියමිත ප්‍රතිශෝධිත වැටුප පදනම් කර ගෙනය.

අ.පි.බ.

05. ඉහත අංක 04 ඡේදයෙහි සඳහන් දීමනාවලට අමතරව වැටුප පදනම් කරගෙන හෝ නියත වශයෙන් විශේෂිත කාර්යයන් වෙනුවෙන් හෝ අඛණ්ඩව මාසිකව ගෙවනු ලබන සියළුම දීමනා සමාලෝචනය කිරීමට ද තීරණය කර ඇති හෙයින් මෙම චක්‍රලේඛය අනුව එම දීමනා ප්‍රතිශෝධනය නොකළ යුතුය. ඒ අනුව, 2005.05.01 දිනට පසුව ද එම දීමනා ගෙවීම අවශ්‍යයැයි අදහස් කරන්නේ නම් එකී දීමනා සමාලෝචනය කිරීම සඳහා ඒ පිළිබඳ විස්තර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ද පිටපතක් සහිතව පරිපාලනය සඳහා වන ජාතික සභාව වෙත යොමු කළ යුතුය. ඒවා ප්‍රතිශෝධනය කිරීම එම සභාව විසින් නිර්දේශ කිරීමෙන් පසුව ඒ සඳහා රජයේ අනුමතිය ලබාගන්නා තෙක් දැනට ගෙවනු ලබන දීමනා 2004.11.30 දින මූල්‍ය වටිනාකමට සීමා කළ යුතු අතර ඒවා මෙම චක්‍රලේඛය අනුව ප්‍රතිශෝධනය නොකළ යුතුය.

06. කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති පුද්ගලයින්ට එම කොන්ත්‍රාත්තු කාලය තුල හිමිවිය යුත්තේ දැනටමත් ගිවිසගෙන ඇති වැටුප හෝ දීමනාව පමණි.

07. මෙම චක්‍රලේඛයේ උපදෙස් වැරදි ලෙස අර්ථකථනය කිරීම හෝ වැරදි ලෙස යොදා ගැනීම හෝ අක්‍රමවත් ලෙස වැටුප් ප්‍රතිශෝධනය කිරීම හෝ වෙනත් වැරදි හේතුකොට ගෙන හෝ සිදුවන ඕනෑම වැඩිපුර ගෙවීමක් එම ගෙවීම ලබාගත් සේවකයන්ගෙන් අප්‍රමාදව ආපසු අයකර ගත යුතු බව සටහන් කර ගතයුතුය.

08. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල වැටුප් ව්‍යුහයන් ආයතනයෙන් ආයතනයට වෙනස් වන හෙයින් හා 2004.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත කී වැටුප් වැඩිවීම ක්‍රියාත්මක කල යුතු හෙයින් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 21 යටතේ අනුමත කරවා ගත් වැටුප් පරිමාණයන් මත යෝජිත වැටුප් ප්‍රතිශෝධනය සකස් කොට වැටුප් ගෙවීම සඳහා මෙයින් අවසර දෙනු ලැබේ. එසේ වුවද, ඒ ඒ ආයතන, යෝජිත ප්‍රතිශෝධිත වැටුප් පරිමාණයන් ආගණනය කර ඒවා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 21 අනුව වැටුප් ප්‍රතිශෝධන අනුමත කරන ලද ලිපියේ පිටපතක්ද සමග 2005.01.31 දිනට ප්‍රථම (අමාත්‍ය මණ්ඩල අනුමතිය හෝ භාණ්ඩාගාර අනුමතිය මත 2004.01.01 දිනට පසුව සිදුකර ඇති වැටුප් ප්‍රතිශෝධන තිබේනම් ඒවායේ පිටපතක්ද සමග) අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අනුමතිය සඳහා ඉදිරිපත් කළ යුතුවේ.

09. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 21 අනුව 2004.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරන ලද වැටුප් පරිමාණයන්ට පරිබාහිරව යම්කිසි ආයතනයක් එහි සේවකයන් සඳහා අමාත්‍ය මණ්ඩලයේ හෝ භාණ්ඩාගාරයේ හෝ අනුමතියකින් තොරව වැටුප් ප්‍රතිශෝධනයක් කර තිබේ නම් එබඳු ආයතන මෙම චක්‍රලේඛය පරිදි වැටුප් ප්‍රතිශෝධනය කිරීමට මත්තෙන් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමතිය ලබාගත යුතුය. එසේම, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 21 අනුව වැටුප් ප්‍රතිශෝධනයන් සිදුකර ඇති නමුත් ඒ සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමතිය මෙතෙක් ලබා නොමැති ආයතන වේනම්, එම ආයතන ද ප්‍රතිශෝධිත නව වැටුප් පරිමාණයන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමතිය සඳහා 2005.05.31 දිනට ප්‍රථම ඉදිරිපත් කල යුතුය.

10. දෛනික වැටුප තීරණය කළයුත්තේ, අදාල තනතුර සඳහා අනුමත නව ප්‍රතිශෝධිත වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපෙන් 1/30 ක ප්‍රමාණයකට සමාන වන පරිදිය.

11. මෙම චක්‍රලේඛයෙහි අන්තර්ගත කරුණු තරයේ පිළිපැදීම සඳහා අදාළ සියලු පාර්ශ්වයන්ට දැනගන්නට සලස් වන මෙන් ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

අ.ක./එස්.බී. දිවාරත්න,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම් සහ
භාණ්ඩාගාරයේ වැඩ බලන ලේකම්.

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. විගණකාධිපති.